## 2024-01-08 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. මුදල් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයට අදාළව ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශ

රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කර ගැනීම අරමුණු කරගෙන පළාත් සභා සඳහා අවශ්‍ය වන සම්පත් ප්‍රමාණය තක්සේරු කිරීමත්, ජාතික අයවැයෙන් පළාත් සභා වෙත වෙන් කෙරෙන ප්‍රතිපාදන වඩාත් අර්ථාන්විත ලෙස පළාත් සභාවලට ලබා දීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමත් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ අනුව්‍යවස්ථාව යටතේ මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. එම කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයට අදාළව ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද පහත සඳහන් නිර්දේශ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

* 2024 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම සම්බන්ධයෙන් වන නිර්දේශ.
* 2024 වර්ෂය සඳහා රජයේ ප්‍රදාන පළාත් සභා අතර වෙන් කර දීම සම්බන්ධයෙන් වන නිර්දේශ.
* පළාත් සභා සඳහා වඩාත් අර්ථාන්විත පරිදි සම්පත් වෙන් කර දීම හා එකී සම්පත් කාර්යක්ෂම ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය නිර්දේශ.

එමෙන්ම, 2024 වර්ෂයට අදාළව මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති එම කොමිෂන් සභාවේ නිර්දේශ සහිත වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ(7) අනුව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා ද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

### 02. අනුරාධපුර මහා විහාර සංවර්ධන සැලැස්ම

අනුරාධපුර මහා විහාරය ශ්‍රී ලංකාවේ ආගමික හා ඓතිහාසික වශයෙන් සුවිශේෂී වටිනාකමක් සහිත පරිශ්‍රයක් වන බැවින්, අනුරාධපුර මහා විහාරයේ ගවේෂණ හා සංරක්ෂණ කටයුතු විධිමත්ව හා නිශ්චිත කාලරාමුවක් තුළ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, මහා විහාරය ගවේෂණය, කැණීම් හා සංරක්ෂණ ව්‍යාපෘතිය

ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගරු ජනාධිපතිතුමාගේ දැනුම් දීම මත පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර අත්දැකීම් සහිත ප්‍රවීණ විදේශීය විශේෂඥයෙකු වන මහාචාර්ය රොබින් කනින්හැම් මහතා විසින් ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර තිබේ. එකී ව්‍යාපෘති වාර්තාව මඟින් 2024 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා වසර 06ක කාලසීමාවක් තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. මහාචාර්ය රොබින් කනින්හැම් මහතාගේ ව්‍යාපෘති වාර්තාව අනුව මහා විහාර ගවේෂණය, කැණීම හා සංරක්ෂණ කටයුතු, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ සෘජු අධීක්ෂණය යටතේ ජනාධිපති කාර්යාලය සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම

නව විද්‍යාත්මක සොයා ගැනීම්, තාක්ෂණික නවෝත්පාදන සහ තිරසර සංවර්ධනය යන තීරණාත්මක අංශවල නායකත්වය දීමට දක්ෂ වෘත්තිකයින් පිරිසක් බිහි කිරීම සඳහා පදනම සකස් කිරීමේ අරමුණින් ඇමෙරිකා එක්සත් ජනපදයේ කීර්තිමත් විශ්වවිද්‍යාලයක සහාය ලබා ගනිමින් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලයක් පිහිටුවීමේ යෝග්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. එවැනි විශ්වවිද්‍යාලයක් මඟින් අතිනවීන ක්‍රමවේද උපයෝගී කර ගැනීමට, ගෝලීය අධ්‍යයන සම්බන්ධතා පෝෂණය කිරීමට සහ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා මූලික පරිසරයක් ඇති කිරීමට හැකියාව ලැබෙනු ඇත. UC Berkeley, UC Riverside, UC Davis, University of Michigan යන විශ්වවිද්‍යාල ඇතුළුව හඳුනාගනු ලබන විශ්වවිද්‍යාල කිහිපයක් අතුරින් එක් හවුල්කාරී විශ්වවිද්‍යාලයක් තෝරා ගෙන එකී විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිතාවයෙන් යුතුව රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් වශයෙන් යෝජිත විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. නව ආයෝජන කලාප ස්ථාපනය කිරීම

අපනයන ඉලක්ක කරගත් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාව 2022 වර්ෂයේ අයවැය කථාවේදී අවධාරණය කරන ලදී. ඒ අනුව, පහත සඳහන් පරිදි නව ආයෝජන කලාප සංවර්ධනය කිරීමේ යෝග්‍යතාව හඳුනාගනු ලැබ ඇත:

* උතුරු, නැගෙනහිර, වයඹ හා දකුණු පළාත් තුළ නව ආයෝජන කලාප ස්ථාපිත කිරීම.

* මාන්කුලම්, පරන්තන් රසායන ද්‍රව්‍ය සමාගම් පරිශ්‍රය සහ කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථා පරිශ්‍රය පිහිටි ප්‍රදේශවල නව ආයෝජන කලාප ස්ථාපිත කිරීම.

* ඉරණවිල හා ත්‍රිකුණාමලය ප්‍රදේශවල නව ආයෝජන කලාප ස්ථාපිත කිරීම.

* බිංගිරිය හා හම්බන්තොට ආයෝජන කලාප තවදුරටත් පුළුල් කිරීම.

යෝජිත ආර්ථික කලාප ඇති කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ සහාය ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, සුදුසු රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතියක් පදනම් කර ගනිමින් එකී ආයෝජන කලාප සංවර්ධනය කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. කසක්ස්ථානයේ අස්තානා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීම

කසක්ස්ථානය සහ ශ්‍රී ලංකාව අතර පවතින රාජ්‍යතාන්ත්‍රික සබඳතා තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් කසක්ස්ථානයේ අස්තානා හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයක් පිහිටුවීම යෝග්‍ය බවට හඳුනා ගනු ලැබ ඇත. ආසියාවේ අන්තර් ක්‍රියා හා විශ්වාසය ගොඩනැංවීමේ පියවර පිළිබඳ සමුළු ලේකම් කාර්යාලය (CICA) කසක්ස්ථානයේ පිහිටුවීම සහ ශ්‍රී ලංකාව එම සමුළුවේ සාමාජිකයෙකු වීම මත මධ්‍යම ආසියානු කලාපය සමඟ සම්බන්ධවීම සඳහා ශ්‍රී ලංකාවට මහඟු අවස්ථාවක් නිර්මාණය වී තිබේ. එමෙන්ම, කසක්ස්ථානයේ සිට ශ්‍රී ලංකාවට සිදු වන සංචාරක පැමිණීම්හි සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන බැවින් ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලයක් අස්තානාහි පිහිටුවීම, දෙරට අතර සංචාරක හා සංස්කෘතික සහයෝගීතාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා උපකාරි වනු ඇත. ඒ අනුව, යෝජිත ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කසක්ස්ථානයේ අස්තානාහි ස්ථාපිත කිරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල නැවත විවෘත කිරීම**

2021/2022 කාල පරිච්ඡේදය තුළ තාවකාලිකව වසා දමන ලද පහත සඳහන් ශ්‍රී ලංකා දූත මණ්ඩලයන් නැවත විවෘත කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ තිබේ:

(i) සයිප්‍රසයේ ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් කාර්යාලය, නිකෝසියා.

(ii) ඉරාකයේ බැග්ඩෑඩ්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය.

(iii) ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට්හි ශ්‍රී ලංකා කොන්සල් ජෙනරාල් කාර්යාලය.

ඒ අනුව, ඉහත සඳහන් ශ්‍රී ලංකා දූත මණ්ඩලයන් නැවත විවෘත කිරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ටර්ක්මෙනිස්තානයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර 2023 සිට 2025 දක්වා වන සහයෝගීතා වැඩසටහන**

ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ටර්ක්මෙනිස්තානයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර 2023 සිට 2025 වසර දක්වා වන කාලසීමාව සඳහා සහයෝගීතා වැඩසටහන් ගිවිසුමක් අත්සන් කිරීමට දෙපාර්ශ්වය එකඟතාවකට පැමිණ ඇත. දෙරට අතර දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික සහයෝගීතාව ඇතුළු ද්විපාර්ශ්වික සබඳතා ප්‍රවර්ධනය කිරීම, ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම මෙන්ම, අන්‍යෝන්‍ය ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම මෙම සහයෝගීතා වැඩසටහනේ පරමාර්ථයන් වේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ටර්ක්මෙනිස්තානයේ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර යෝජිත සහයෝගීතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ජපානයේ, ටෝකියෝ - නරීටා ගුවන්තොටුපොළෙහි දී සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගුවන් යානා සඳහා බිම් මෙහෙවර සේවා සපයා ගැනීම පිණිස වන කොන්ත්‍රාත්තුව පිරිනැමීම**

ජපානයේ, ටෝකියෝ - නරීටා ගුවන්තොටුපොළෙහි දී සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගුවන් යානා සඳහා බිම් මෙහෙවර සේවා සැපයීම පිණිස සුදුසු සේවා සපයන්නෙකු තෝරා ගැනීම සඳහා සීමිත ජාත්‍යන්තර ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇති අතර, ඒ සඳහා ලංසු 02ක් ලැබී තිබේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි, සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුව ඉදිරිපත් කර තිබූ International Air Cargo Terminal Co. Ltd. වෙත 2024-08-01 දින සිට 2027-07-31 දින දක්වා ටෝකියෝ - නරීටා ගුවන්තොටුපොළේ බිම් මෙහෙවර සපයා ගැනීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **කිලෝමීටර 100,000ක විකල්ප මාර්ග, අතුරු මාර්ග, ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම**

මාර්ග කිලෝමීටර 100,000ක වැඩසටහන යටතේ ආරම්භ කර දැනට ඉදි කිරීම් කටයුතු අත්හිටුවා ඇති මාර්ග අතුරින් ආරක්ෂිතව ගමනාගමනයට සුදුසු පරිදි කිලෝමීටර 1,500ක් 2024 වර්ෂය තුළදී වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා වන සම්පූර්ණ පිරිවැය රුපියල් බිලියන 20ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2024 වර්ෂයේ මාස හයක් (06) ඇතුළත වැඩ නිම කිරීමට යෝජිතය. ඒ අනුව, වර්ෂයේ මුල් මාස හයක (06) කාලසීමාව තුළ තෝරාගත් මාර්ග ගමනාගමනයට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා වන වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2023 විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (නඩු භාණ්ඩ බැහැර කිරීම) පිළිබඳ නියෝග**

විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 77අ වගන්තියෙහි (6) උපවගන්තිය යටතේ ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් ඇතුළුව නඩු භාණ්ඩ බැහැර කිරීමේ ක්‍රමවේදය අධිකරණ සේවා කොමිෂන් සභාවේ එකඟතාව ඇතිව නියෝග මඟින් නියම කිරීමට අධිකරණ විෂයභාර අමාත්‍යවරයා වෙත බලතල පැවරී ඇත. නීතියේ

පරාමිතීන්ට අනුකූලව ඖෂධ, ද්‍රව්‍යය, භාණ්ඩ හෝ සැකසුම් නාඩු භාණ්ඩ බැහැර කිරීමේ යාන්ත්‍රණය නියම කරමින් අංක 2360/21 දරන 2023-11-27 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති, 2023 විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (නාඩු භාණ්ඩ බැහැර කිරීම) පිළිබඳ නියෝග අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **වොරින්ටන් හොකී පිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

වොරින්ටන්හි පිහිටි කෘත්‍රිම හොකී ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු 2009 වර්ෂයේදී සිදු කර ඇති අතර, එම ක්‍රීඩාංගණයේ තණ තීරුව කාලය ඉකුත් වීම හේතුවෙන් හා ප්‍රමාණය ඉක්මවා භාවිත කිරීම හේතුවෙන් ක්‍රීඩා කිරීමට නුසුදුසු තත්ත්වයට පත්ව තිබේ. එම ක්‍රීඩාංගණය සඳහා කෘත්‍රිම තණ තීරුවක් නොමිලයේ ලබා දීමට ආසියානු හොකී සම්මේලනය එකඟතාව පළ කර ඇත. ඒ අනුව, වොරින්ටන් හොකී ක්‍රීඩා පිටිය සඳහා අවශ්‍ය කෘත්‍රිම තණ තීරුව ආසියානු හොකී සම්මේලනය මඟින් ලබා ගැනීමට සහ එම ක්‍රීඩා පිටිය ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සංවර්ධනය කිරීම පිණිස ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **රජයේ සේවකයින්ට ගෙවන ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම**

2024 වර්ෂයේ අයවැය යෝජනා මඟින් රාජ්‍ය සේවක ජීවන වියදම් දීමනාව 2024 ජනවාරි මාසයේ සිට රුපියල් 10,000/-කින් ඉහළ දැමීමටත්, එම දීමනාව 2024 අප්‍රේල් මාසයේ සිට ලබා දීමටත් රජය සැලසුම් කර තිබුණි. පවත්නා දුෂ්කර ආර්ථික වාතාවරණය හේතුවෙන් එම දීමනාවෙන් කොටසක් හෝ වසරේ මුල් මාස කිහිපය තුළ ලබා දෙන ලෙස විවිධ පාර්ශ්වයන් වෙතින් ඉල්ලීම් ඉදිරිපත්ව ඇත. ඒ අනුව, රට තුළ පවතින ආර්ථික වාතාවරණය හේතුවෙන් ඇති වී තිබෙන පීඩනය ද සැලකිල්ලට ගෙන, සියලුම රජයේ සේවකයින්ට 2024 ජනවාරි මාසයේ සිට වැඩි කරන ලද ජීවන වියදම් දීමනාවෙන් 50%ක්, එනම් රුපියල් 5,000/-ක් ලබා දීමටත්, වෛද්‍යවරුන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් වෙත ගෙවනු ලබන ඇතැම් දීමනා ඉහළ දැමීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************